කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOME 3035 - උසස් මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : (තුනයි ) 03 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ . මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග නම් කර නිර්වචනය කරන්න.

(ලකුණු 07)

ඇ. කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ වැදගත්වන්නේ කෙසේද යන්න මූලික හා වැඩිදියුණු කිරීම් ගුණාත්මක ලක්ෂණ විශ්ලේෂණය කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 25 යි)**

**ප්‍රශ්න අංක - 02**

ඇල්ෆා ලිමිටඩ්, බීටා ලිමිටඩ් හි ශුද්ධ වත්කම්වලින් 75%ක් 2023.04.01 දින අත්පත් කරගන්න ලදී. අත්පත් කර ගන්නා දිනයේ දී පාලනය අහිමි හිමිකමේ සාධාරණ අගය රු. 2,200,000කි. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ඇල්ෆා සමාගම් සමූහයේ තනි පුද්ගල මූල්‍ය ප්‍රකාශන ඔබට පහත පරිදි ලබා දී ඇත.

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | ඇල්ෆා | බීටා |
|---|---|---|
| ආදායම | 13,568,225 | 10,420,712 |
| විකුණුම් පිරිවැය | (10,221,430) | (8,111,900) |
| **දළ ලාභය** | **3,346,795** | **2,308,812** |

| | | |
|---|---|---|
| | | |
| වෙනත් අදායම් | 132,000 | 4,500 |
| පරිපාලන වියදම් | (943,235) | (622,900) |
| බෙදාහැරීමේ වියදම් | (1,028,328) | (712,800) |
| **මෙහෙයුම් ලාභය** | **1,507,232** | **977,612** |
| මූල්‍ය වියදම් | (323,450) | (488,950) |
| **බදු පෙර ලාභය** | **1,183,782** | **488,662** |
| බදු | (428,200) | (94,500) |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | **755,582** | **394,162** |

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ඇල්ෆා | බීටා |
|---|---|---|
| ප්‍රකාශ කල ප්‍රාග්ධනය | 6,000,000 | 3,000,000 |
| **රඳවාගත් ලාභය** | | |
| 2023.04.01 දිනට ශේෂය | 1,512,854 | 1,492,900 |
| ශුද්ධ ලාභය | 755,582 | 394,162 |
| ගෙවූ ලාභාංශ | 156,000 | 100,000 |
| 2024.03.31 දිනට ශේෂය | 2,112,436 | 1,787,062 |
| | **8,112,436** | **4,787,062** |

## 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | ඇල්ෆා | බීටා |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත හා උපකරණ | 4,325,270 | 4,328,150 |
| ආයෝජන - බීටා | 2,450,000 | |
| වෙනත් ආයෝජන | 185,000 | 75,000 |
| | **6,960,270** | **4,403,150** |
| ජංගම වත්කම් | | |
| තොගය | 822,600 | 612,850 |
| වෙළෙඳ ණයගැතියෝ | 456,750 | 343,600 |
| සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ මුදල | 21,500 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 977,466 | 677,362 |
| | **2,278,316** | **1,633,812** |
| | **9,238,586** | **6,036,962** |
| | | |
| ප්‍රාග්ධනය හා වගකීම් | | |
| ප්‍රාග්ධනය | | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | 6,000,000 | 3,000,000 |
| රඳවාගත් ලාභය | 2,112,436 | 1,787,062 |
| | **8,112,436** | **4,787,062** |
| ජංගම නොවන වගකීම් | | |
| පොලී සහිත ණය ගැනීම් | 522,200 | 792,000 |
| | | |
| ජංගම වගකීම් | | |
| පොලී සහිත ණය ගැනීම් | 95,800 | 125,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 383,500 | 288,950 |
| සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ මුදල | | 1,500 |
| බදු | 124,650 | 42,450 |
| | **603,950** | **457,900** |
| | **9,238,586** | **6,036,962** |

අතිරේක තොරතුරු

1. 2023 මැයි 20 වන දින ඇල්ෆා ලිමිටඩ් විසින් බීටා ලිමිටඩ් වෙත රු.315,000 ක් වටිනා භාණ්ඩ විකුණන ලදී. මෙම ගනුදෙනුවේ දළ ලාභ ආන්තිකය 20% කි. මූලා තත්ත්ව ප්‍රකාශනයේ දිනට එම භාණ්ඩ වලින් 30%ක් බීටා ලිමිටඩ් හි අවසන් තොගයේ පැවතුනි

2. තවද, බීටා ලිමිටඩ් විසින් ඇල්ෆා ලිමිටඩ් වෙත පිරිවැය රු. 352,000ක් වන භාණ්ඩ රු. 415,000ක් කට විකුණා ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට එම භාණ්ඩ වලින් 15%ක් ඇල්ෆා ලිමිටඩ් හි අවසන් තොගයේ පැවතුනි

3. ආයතන දෙක අතර වූ ගනුදෙනුවක ප්‍රතිපලයක් ලෙස ඇල්ෆා ලිමිටඩ් හි ණය හිමියන් තුල බීටා ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. 30,000ක් වාර්තා කර ඇත, මෙම මුදල බීටා ලිමිටඩ් ඔවුන්ගේ වෙළඳ ණයගැතියන් යටතේ වාර්තා කර ඇත.

4. ඇල්ෆා සඳහා ගෙවිය යුතු මුදලෙහි කොටසක් පියවීම සඳහා, 2024 මාර්තු 30 වැනි දින බීටා ලිමිටඩ් විසින් සිදු කරන ලද රු. 20,000 මුදල් ගෙවීම ඇල්ෆා ලිමිටඩ් හි පොත්වල සටහන් කර නොමැත.

ඔබ විසින් පහත දෑ පිලියල කල යුතුය.

අ. 2024.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇල්ෆා සමූහයේ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය

ආ. 2024.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇල්ෆා සමූහයේ ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

ඇ. 2024.03.31 දිනට ඇල්ෆා සමූහයේ **ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**

**(මුළු ලකුණු 40 යි)**

ප්‍රශ්න අංක - 03

2024.03.31 දිනට සීමාසහිත සඳමාලි සමාගම විසුරුවාහැරීමට තීරණය කල අතර එම ආයතන ඔවුන්ගේ අවසාන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 2024.03.31 දිනට පිළියල කරන ලදී.

සීමාසහිත සඳමාලි සමාගම

2024.03.31 දිනට

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| වත්කම් | රු. | රු. |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් | 9,800,000 | |
| ගොඩනැගිලි | 12,500,000 | |
| පිරියත හා යන්ත්‍ර | 12,750,000 | |
| උපකරණ | 12,910,000 | |
| | | |
| ජංගම වත්කම් | | |
| තොගය | 7,200,000 | |
| වෙළෙඳ ණය ගැතියෝ | 10,100,000 | |
| කලින් ගෙවූ වියදම් | 2,000,000 | |
| මුදල් | 4,685,000 | |
| මුළු වත්කම | | 71,945,000 |
| | | |
| ප්‍රාග්ධනය හා වගකීම් | | |
| ප්‍රාග්ධනය | | |
| 15%, වරණිය කොටස් ප්‍රාග්ධනය | 35,000,000 | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 200,000 ක් එකක් රු.100 බැගින්) | 20,000,000 | |
| හිග ඇරයුම (කොටස් 6000, Rs. 10 බැගින්) | (80,000) | |
| 2023.04.01 දිනට සංචිත | (11,820,000) | |
| වසරේ ලාභය හෝ (අලාභය) | (4,935,000) | 38,165,000 |
| | | |

| | | |
|---|---|---|
| <u>ජංගම නොවන වගකීම්</u> | | |
| 12% උකස් ණය (ඉඩම මත සුරක්ෂිත ණය) | 8,800,000 | |
| 14%, බැංකු ණය (ගොඩනැගිල්ල මත සුරක්ෂිත ණය) | 9,400,000 | |
| 10%, රු. 100, ණයකර | 8,000,000 | 26,200,000 |
| | | |
| <u>ජංගම වගකීම්</u> | | |
| වෙළෙඳ ණය හිමියෝ | 660,000 | |
| ගෙවිය යුතු වරණිය කොටස් ලාභාංශ | 200,000 | |
| කළමනාකර අධ්‍යක්ෂකගේ වැටුප | 200,000 | |
| වැටුප් හා වේතන (මාස 5ක් සඳහා) | 3,000,000 | |
| ගෙවිය යුතු ණයකර පොලිය | 600,000 | |
| ගෙවිය යුතු අදායම් බදු – 20/21 | 2,000,000 | |
| 21/22 | 800,000 | |
| 22/23 | 120,000 | 7,580,000 |
| | | <u>**71,945,000**</u> |

2007 අංක 07 දරන සමාගම් පනතේ 283 වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගමේ ලේකම්වරයා පහත තොරතුරු භාවිතා කරමින් සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය සහ අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීමට නියමිතය

i. වත්කම් පහත පරිදි උපලබ්ධි කරයි
ඉඩම - රු. 10,200,000
ගොඩනැගිල්ල - රු. 9,000,000
පිරියත හා යන්ත්‍ර - රු. 10,500,000
උපකරණ - රු. 12,000,000
තොගය - රු. 7,000,000

ii. වෙළඳ ණයගැතියන්ගේ මුදල් ලැබීම් මත පදනම්ව එක් එක් ණය ගැති කාණ්ඩයේ ප්‍රමාණය පහත පරිදි හඳුනා ගත හැක.

හොඳ ණය ගැතියන් - රු. 2,250,000

සැක සහිත ණය ගැතියන් -රු. 3,000,000 (මෙයින් 70%ක් ලබා ගත හැකි ලෙස ඇස්තමේන්තු කර ඇත.)

ඉතිරි ණය ගැතියන් බෝල් ණය ලෙස සලකනු ලැබේ

iii. පෙරගෙවුම් වියදම් වලින් පෙන්වන්නේ කාර්යාලයට ගෙවන කුලියයි. කාර්යාල හිමිකරු රු. 1,500,000 ක් නැවත ලබාදීමට එකග විය.

iv. සමාගම හිඟ හිටි ඇරයුම් මුදල් කැඳවා ඇති අතර, එයින් රු 50,000 ක් ලැබේ යැයි අදහස් කෙරේ.

v. සේවකයෙකු සමාගමට එරෙහිව නඩුවක් ගොනු කළේය; වන්දි වශයෙන්, සමාගම එම සේවකයාට රු. 75,000 ක් ගෙවිය යුතුය. මෙම වගකීම තවමත් සමාගමේ පොත්වල සටහන් කර නොමැත

vi. වගකීම් පහත පරිදි පියවිය යුතුය.

වෙළඳ ණය හිමියන් - රු. 700,000 කි (දඩමුදලක් සමඟ)

කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ වැටුප - රු. 150,000 කි

අනෙකුත් වගකීම් සම්පූර්ණයෙන් පියවිය යුතුය.

vii. 2020 අප්‍රේල් 01 වන දින ට රඳවාගත් ලාභ ශේෂය රු. 8,500,000 කි. සමාගම 2020/21 වර්ෂයේදී රු. 5.100,000 ක වෙළෙඳලාභ ලද අතර රු.6,450,000 ක් හා රු.4,000,000 ක් පිළිවෙලින් සමාන්‍ය හා වරණීය ලාභාංශ ගෙවන ලදී. 2021/22,2022/23 වර්ෂ තුලදී සමාගම පිළිවෙලින් රු.820,000 ක් හා රු.2,150,000 ක් වෙළෙඳ පාඩු ලද අතර රු.4,000,000 ක වරණීය ලාභාංශ ගෙවා ඇත.

ඉහත තොරතුරු භාවිතා කිරීමෙන්, ඔබ විසින් පහත දෑ පිලියල කල යුතුය.

අ. සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය

ආ ඌනතා හෝ අතිරික්ත ගිණුම

(මුළු ලකුණු 35 යි)